අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/05/68/12/දේ.නි.(14/2022 II)
ඔබේ යොමුව / உமது இல. / Your Ref. }
දිනය / திகதி / Date } 2023.01.31

සියලුම අතිරේක ලේකම්වරුන්,
ප්‍රධාන මූල්‍ය නිලධාරීන්,
අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
විභාග කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන),
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යපන අධ්‍යක්ෂවරුන්,
පීඨාධිපතිවරුන් (අධ්‍යාපන විද්‍යාපීඨ),
විදුහල්පතිවරුන් (ගුරු විද්‍යාල),
විදුහල්පතිවරුන් (ජාතික පාසල්),
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**රා.ප.ච.14/2022, 14/2022(I) හා 14/2022(II) දේශීය/විදේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු අයදුම් කිරීමට පූර්ව අනුමැතිය ලබා ගැනීම.**

අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන සියලුම සේවාවන්ට අයත් නිලධරයන්ට රා.ප.ච.14/2022, 14/2022(I) හා 14/2022(II) දේශීය/විදේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු ලබාදීම සඳහා රා.ප.ච.14/2022 හි 04 ඡේදයේ "ක" වගන්තිය ප්‍රකාරව පහත ක්‍රමවේදය හඳුන්වා දීමට තීරණය කර ඇත.

02. ඒ අනුව, දේශීය/විදේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු අයදුම් කිරීමට පෙර පූර්ව අනුමැතිය ලබා ගැනීම සඳහා මේ සමඟ අමුණා ඇති තොරතුරු පත්‍රිකාව සම්පූර්ණ කර පහත පරිදි සිය සේවාවට අදාළ අතිරේක ලේකම් හෝ බලය පවරන ලද මාණ්ඩලික නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා) - ඒකාබද්ධ සේවාවන් හා දෙපාර්තමේන්තු ගත තනතුරු දරණ කාර්යය මණ්ඩලය
- අතිරේක ලේකම් (ආයතන) - ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය හා ශ්‍රී ලංකා ගුරු සේවය
- අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා) - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය

03. නිලධරයන් විසින් ඉහත පරිදි දේශීය/විදේශීය වශයෙන් වැටුප් රහිත නිවාඩු අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් විධිමත් පරිදි නිවාඩු ඉල්ලුම් කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

04. තවද, මෙම ක්‍රමවේදය 2023.02.01 දින සිට ක්‍රියාත්මක වන බව වැඩිදුරටත් දන්වමි.

අත්/ කළේ: එම්.එන්. රණසිංහ
අධ්‍යාපන ලේකම්

පී.එල්. පත්මකුමාර
අතිරේක ලේකම් (පාලන)

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 | +94112784825 | minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary } +94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk